ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක : PS/CSL/Circular/7/2026

මගේ අංකය : PS/CSL/SO/3/5/6/Dengue (Part - III)

2026 ජූනි මස 23 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්
සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියලුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**ඩෙංගු රෝගය වැළැක්වීම සහ පාලනය**

ශ්‍රී ලංකාව තුළ මේ වන විට දිනෙන් දින ඩෙංගු රෝගය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් අධි අවදානම් තත්ත්වයක් දක්වා වර්ධනය වෙමින් පවතී. මේ තත්ත්වය වළක්වා ගැනීම සඳහා සියලු ආයතනවල සක්‍රිය දායකත්වයෙන් යුතුව කඩිනමින් ඩෙංගු මර්දන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු ය.

01. ජාතික ඩෙංගු මර්දන ඒකකයේ සංඛ්‍යාලේඛන දත්ත අනුව බස්නාහිර පළාත අධි අවධානම් කලාපයක් ලෙස හඳුනාගෙන ඇති අතර දිවයින පුරා රෝග ව්‍යාප්තිය සීඝ්‍රයෙන් වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. මෙවැනි පසුබිමක් තුළ ඩෙංගු රෝගය අධි වසංගත තත්ත්වයක් බවට පත්වීම වැළැක්වීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර ඩෙංගු මර්දන කටයුතු ජාතික, පළාත්, දිස්ත්‍රික්, ආයතන, ග්‍රාමීය හා නිවාස මට්ටමින් සෞඛ්‍ය අංශවල සහයෝගය ද ඇතිව ක්‍රියාත්මක කිරීමට සියලු ආයතන ප්‍රධානීන් කැපවී කටයුතු කළ යුතු වේ. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේ පැවති සාකච්ඡාවක දී මේ සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලදී. එම සාකච්ඡාවේ දී **2026 ජූනි මස 24 දින සිට 26 දින** දක්වා දින තුන ඩෙංගු මර්දන දිනයන් ලෙස ප්‍රකාශයට පත් කිරීමටත්, එම දින තුන තුළ දිවයින පුරා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් තීරණය විය.

02. මේ යටතේ මදුරුවන් බෝවීමේ අවදානම් සහිත ස්ථාන ලෙස හඳුනාගෙන ඇති හෝ මදුරුවන් බෝවන ස්ථාන ලෙස සැක කළ හැකි රාජ්‍ය සහ පෞද්ගලික ආයතන, ඉදිකිරීම් පරිශ්‍ර, පාසල්, ආගමික ස්ථාන, ධීවර වරායන් ආශ්‍රිත ප්‍රදේශ, නිවාස හා නගර මධ්‍යයේ ඇති පොදු ස්ථාන පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

03. ඒ සඳහා පහත පරිදි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස අවධාරණය කරමි.

- ආයතනික ඩෙංගු මර්දන වැඩපිළිවෙළ

i. සියලු ම රාජ්‍ය ආයතන පරිශ්‍රයන් මදුරුවන් බෝවන ස්ථානවලින් තොර බවට සහතික කිරීම ආයතන ප්‍රධානීන්ගේ ඍජු වගකීමකි.

ii. වැඩසටහනට ආරම්භයක් ලෙස 2026 ජූනි මස 24 දින සිට ජූනි මස 26 දින දක්වා කාලය තුළ සියලු ම සේවකයින්ගේ සක්‍රිය දායකත්වය ලබාගෙන ආයතන පරිශ්‍රයන් පිරිසිදු කිරීම සහ මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීම (ඇමුණුම 01හි සඳහන් පරිදි වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ).

ගාලු මුවදොර, කොළඹ 01. காலி முகத்திடல், கொழும்பு 01. Galle Face, Colombo 01.
දුරකථන தொலைபேசி Telephones +94 (0) 11 2354420 +94 (0) 11 2473873
ෆැක්ස් தொலைநகல் Fax +94 (0) 11 2446657
ඊ - තැපැල මின்னஞ்சல் E-mail prsec@presidentsoffice.lk

CamScanner

iii. එම ක්‍රියාදාමයෙන් පසුව ද සෑම රාජ්‍ය ආයතනයක ම ඩෙංගු මර්දනය පිළිබඳ කටයුතු සොයා බැලීම සිදු කළ යුතු ය. එම කටයුතු නියාමනය සඳහා කමිටුවක් පත් කළ යුතු අතර එම කමිටුවේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබන මදුරු මර්දන ක්‍රියාකාරකම් පිළිබඳව මාසික වාර්තාවක් අදාළ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) වෙත ද පිටපතක් සහිතව තම ආයතන ප්‍රධානියාට වාර්තා කළ යුතු අතර ආයතන ප්‍රධානියා විසින් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත තම ආයතනයේ සමස්ථ ක්‍රියාකාරකම් මාසිකව වාර්තා කළ යුතු ය. අදාල ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් එම වාර්තා නිසි ක්‍රමවේද ඔස්සේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ද ඉදිරිපත් කළ යුතු ය. **මෙම කටයුතුවල සංක්ෂිප්ත වාර්තාවක් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ජනාධිපති ලේකම්වරයා වෙත ද එහි පිටපතක් ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය වෙත ද ඉදිරිපත් කළ යුතු ය. (ඇමුණුම 02හි සඳහන් පරිදි වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ).**

iv. ප්‍රධාන සහ අතුරු මාර්ග දෙපස අපිරිසිදු වී පවතින කානු පද්ධති මදුරුවන් බෝවන ස්ථාන ලෙස ක්‍රියාකරන බව හඳුනාගෙන ඇති බැවින් එම මාර්ග නඩත්තු කිරීමට වගකීම දරන මාර්ග සංවර්ධන අධිකාරිය, සියලු ම පළාත් මාර්ග සංවර්ධන අධිකාරීන් සහ අදාළ අනෙකුත් වගකිවයුතු ආයතන කඩිනමින් අවශ්‍ය පිරිසිදු කිරීම් කටයුතු සිදු කර අදාළ පළාත් අමාත්‍යාංශ ලේකම්/ පළාත් ප්‍රධාන ලේකම් හරහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත වාර්තා කළ යුතු ය. **මෙම කටයුතුවල සංක්ෂිප්ත වාර්තාවක් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ජනාධිපති ලේකම්වරයා වෙත ද එහි පිටපතක් ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය වෙත ද ඉදිරිපත් කළ යුතු ය.**

- **අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ පෙරපාසල් ආයතන සුරක්ෂිත කිරීම.**

i. වැඩසටහනට ආරම්භයක් ලෙස පාසල් දරුවන් සහ අධ්‍යයන/ අනධ්‍යයන කාර්ය මණ්ඩල වසංගත අවදානමෙන් මුදවා ගැනීම උදෙසා සියලු ම පාසල්, පිරිවෙන්, ගුරු විද්‍යාල, විද්‍යාපීඨ සහ උසස් අධ්‍යාපන ආයතන පරිශ්‍රයන් තුළ ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන සොයා විනාශ කළ යුතු අතර එම ආයතන පිරිසිදු කිරීම තම කාර්ය මණ්ඩල, දෙමාපියන් සහ අදාළ ප්‍රදේශවල ප්‍රජා ශක්ති කමිටු, මහජන ආරක්ෂක කමිටු, තරුණ සංගම් යනාදියේ සහයෝගයන් ලබා ගනිමින් සිදු කළ යුතු ය.

ii. සෑම සතියක ම දින දෙකක (සඳුදා සහ සිකුරාදා) විනාඩි 30 බැගින් වූ කාලයක් වෙන් කර පාසල් පරිශ්‍රය සහ විශේෂයෙන් ප්‍රාථමික අංශවල සිසුන් ගැවසෙන සෙල්ලම් මිදුල් ඇතුළුව ටයර්, ප්ලාස්ටික් උපකරණ, කොන්ක්‍රීට් වහලවල් සහ වැහිපිහිලි පරීක්ෂා කර මදුරුවන් බෝවන ස්ථාන නොමැති බව තහවුරු කරගත යුතු ය.

iii. පාසල්වල පවතින ශිෂ්‍ය සංඛ්‍යාව මත පදනම්ව සිසුන්, ගුරුවරුන් සහ දෙමාපියන්ගෙන් සැදුම්ලත් පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටු/ ඩෙංගු මර්දන කමිටු පහත පරිදි වහා ම ස්ථාපිත කර සක්‍රීය කළ යුතු ය.

- ශිෂ්‍ය සංඛ්‍යාව 1-200 දක්වා - කමිටු 01ක්
- ශිෂ්‍ය සංඛ්‍යාව 201-500 දක්ව - කමිටු 02ක්
- ශිෂ්‍ය සංඛ්‍යාව 501න් ඉහළ - කමිටු 03ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක්.

iv. අවම වශයෙන් මසකට වරක්වත් ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (PHI) මඟින් රාජ්‍ය හා පෞද්ගලික පාසල්, විශ්වවිද්‍යාල, පිරිවෙන් හා උපකාර පන්ති පවත්වන පරිශ්‍රයන් ඩෙංගු බෝවන ස්ථානවලින් තොර බවට වන නිර්දේශ ලබාගත යුතු අතර මේ සම්බන්ධ ඒකාබද්ධ නියාමන වාර්තා සකස් කර රාජ්‍ය අධ්‍යාපන ආයතන සම්බන්ධ වාර්තා කලාප අධ්‍යාපන කාර්යාල හරහා පළාත්

CamScanner

අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ද පෞද්ගලික අධ්‍යාපන ආයතන සම්බන්ධ වාර්තා ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) වෙත ද යොමු කල යුතු ය. එම ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ පළාත් අධ්‍යාපන ලේකම් විසින් ඉහත ක්‍රියාකාරකම්වල සංක්ෂිප්ත වාර්තාවක් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු ය. **මෙම කටයුතුවල සංක්ෂිප්ත වාර්තාවක් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ජනාධිපති ලේකම්වරයා වෙත ද එහි පිටපතක් ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය වෙත ද ඉදිරිපත් කළ යුතු ය.**

- **රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික්, ප්‍රාදේශීය පරිපාලනය විසින් අමාත්‍යාංශ පරිපාලන යාන්ත්‍රණය සහ පළාත් පාලන ආයතන සම්බන්ධීකරණයෙන් කළ යුතු ක්‍රියාකාරකම්**

i. සියලු ම දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය පරිපාලන යාන්ත්‍රණය සහ පළාත් පාලන ආයතනවල සහයෝගය ඇතිව දිවයිනේ සෑම ග්‍රාම සේවා කොට්ඨාසයක ම මදුරුවන් බෝවන ස්ථාන නිරීක්ෂණය කර එම ස්ථාන විනාශ කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු ය. මේ සඳහා අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසවල ක්‍රියාත්මක වන ප්‍රජා ශක්ති කමිටු, මහජන ආරක්ෂක කමිටු, තරුණ සංගම්, ස්වේච්ඡා සංවිධාන සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල ද මහජනතාවගේ ද සහයෝගය ලබා ගැනීමට ක්‍රියා කළ යුතු ය. මෙම කාර්යයන් පළමුව ජූනි මස 24 දින සිට ජූනි මස 26 දින දක්වා ක්‍රියාත්මක කිරීමටත් ඉන් පසුව අවශ්‍යතාවය පරිදි නිරන්තරයෙන් පවත්වාගෙන යාමටත් කටයුතු කළ යුතු අතර සෑම මසක ම තම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළ කටයුතු සම්බන්ධ කෙටි වාර්තාවක් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය. **රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් දිස්ත්‍රික් ක්‍රියාකාරකම් පිළිබඳ සංක්ෂිප්ත කරන ලද වාර්තාවක් ජනාධිපති ලේකම් වෙත ද එහි පිටපතක් ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය වෙත ද ඉදිරිපත් කළ යුතු ය.**

ii. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වල න්‍යාය පත්‍රයේ ප්‍රමුඛ කරුණක් ලෙස ඩෙංගු වසංගත පාලන සැලසුම් සහ එහි ප්‍රගතිය සමාලෝචනය කිරීම අනිවාර්යයෙන් ම සිදු කළ යුතු ය.

iii. සියලු ම දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සෞඛ්‍ය අංශ, පොලිසිය සහ ත්‍රිවිධ හමුදා සහාය ඇතිව ක්‍රියාත්මක කළ ඒකාබද්ධ වැටලීම් හා ශ්‍රමදානවල ප්‍රගති වාර්තාවක් ජාතික ඩෙංගු මර්දන ඒකකය (NDCU) සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත මාසිකව යොමු කළ යුතු ය. **එම කටයුතුවල සංක්ෂිප්ත වාර්තාවක් ජනාධිපති ලේකම්වරයා වෙත ද, එහි පිටපතක් ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය වෙත ද එවීමට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කළ යුතු ය.**

- **අධීක්ෂණය සහ නීතිමය ක්‍රියාමාර්ග**

i. මදුරුවන් බෝවීමේ වැඩි ප්‍රවණතාවක් පවතින කාර්මික පද්ධති, ඉදිකිරීම් පරිශ්‍ර, ආගමික ස්ථාන, ධීවර කටයුතු ආශ්‍රිත ප්‍රදේශ, නිවාස, පොදු ස්ථාන මෙන් ම හිමිකරුවන් නොමැති හෝ අත්හැර දමා ඇති ඉඩම් සහ ගොඩනැගිලි නිරන්තර පරීක්ෂාවට ලක් කළ යුතුය. මෙම ස්ථාන ඩෙංගු මදුරුවන් බෝවන පරිදි නොසැලකිලිමත්ව තබන හිමිකරුවන්ට එරෙහිව පවත්නා නීතිමය ප්‍රතිපාදන යටතේ දැඩිව නීතිය ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන ආයතන කටයුතු කළ යුතු ය.

CS CamScanner

ii. ඩෙංගු මර්දන නීති රීතිවලට අනුගත නොවන සහ මදුරුවන් බෝවන පරිදි පරිශ්‍රයන් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන, ඉඩිකිරීම් භූමි හිමිකරුවන් හෝ සිවිල් වැසියන්ට එරෙහිව පවතින සෞඛ්‍ය ආඥාපනත සහ පළාත් පාලන ආයතන නීතිමය ප්‍රතිපාදන ප්‍රකාරව කිසිදු තරාතිරමකින් තොරව නෛතික රාමුව තුළ දැඩිව නීතිය ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන් සහ පළාත් පාලන ආයතන ප්‍රධානීන් පියවර ගත යුතුය.

iii. ඩෙංගු වසංගතය උත්සන්න අවස්ථාවලදී ජාතික, පළාත් හෝ දිස්ත්‍රික් සෞඛ්‍ය අංශ විසින් ඉල්ලා සිටිනු ලබන ක්ෂේත්‍ර සහාය, මානව සහ භෞතික සම්පත් නොපමාව ලබා දීමට සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

04. ඉහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා පමණක් ම සීමා නොවී ඩෙංගු රෝගය වසංගත තත්ත්වයෙන් පැතිර යාම වැළැක්වීමට ගතහැකි සියලු ක්‍රියාමාර්ග සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කළ යුතු අතර ඉහත උපදෙස් ඔබ යටතේ පවතින සියලු ආයතන වෙතත් නොපමාව දැනුම් දීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

05. මේ සඳහා ඔබ සහ ඔබගේ කාර්ය මණ්ඩලය දක්වන සක්‍රීය දායකත්වය බෙහෙවින් අගය කරමි.

ආචාර්ය එන්.එස්. කුමානායක
ජනාධිපති ලේකම්

පිටපත්:

01. සියලු ම පළාත් ආණ්ඩුකාරවරුන්
02. ගරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු
03. ගරු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු
04. අග්‍රාමාත්‍ය ලේකම්
05. අමාත්‍ය මණ්ඩල ලේකම්
06. විගණකාධිපති
07. ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
08. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
09. මහජන සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
10. අධ්‍යක්ෂ, ජාතික ඩෙංගු මර්ධන ඒකකය

} කාරු. දැ.ග.ස. සහ අ.ක.ස.

CS CamScanner

ඇමුණුම 01

**ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂා කිරීම පිළිබඳ 2026 ජූනි මස 24,25 සහ 26 යන තෙදින තුළ වාර්තාව**

**(රජයේ ආයතන/ පෞද්ගලික ආයතන/ පාසල් සහ අධ්‍යාපන ආයතන/ ඉදිකිරීම් පරිශ්‍ර/ ආගමික ස්ථාන/ ධීවර හා ධීවර වරායන් ආශ්‍රිතව)**

**සාමාන්‍ය තොරතුරු**

| | | |
|---|---|---|
| ආයතනයේ නම | | |
| මාසය | | |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය | | |
| ආයතන තුල ඩෙංගු මර්දන කමිටුවක් | | ඇත/ නැත |
| ආයතනය තුළ පවතින ඩෙංගු මර්දන කමිටුවේ සම්බන්ධීකාරකගේ තොරතුරු | නම | |
| | තනතුර | |
| | දුරකථන අංකය | |
| | විද්‍යුත් ලිපිනය | |

**ස්ථාන පරීක්ෂාව, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඩෙංගු රෝගීන් පිළිබඳ තොරතුරු**

| | | | |
|---|---|---|---|
| ආයතන ප්‍රධානියාගේ හා ඩෙංගු මර්දන කමිටුවේ අධීක්ෂණයෙන් සෑම දිනකම මදුරු මර්දන කටයුතු සිදු කරන ලදී. | ජූනි24 දින | ජූනි25 දින | ජූනි26 දින |
| අදාළ දින තුළ හඳුනාගත් මදුරුවන් බෝ විය හැකි ස්ථාන ගණන | | | |
| අදාළ දින තුළ හඳුනාගත් මදුරුවන් බෝ වූ ස්ථාන ගණන | | | |
| අදාළ දින තුළ නිවැරදි කළ ස්ථාන ගණන | | | |
| නිවැරදි කිරීමට නොහැකි ස්ථාන පිළිබඳව සෞ.වෛ.නි.කාර්යාලයට දැනුම් දෙන ලදී. | ඔව්/ නැත | | |
| සෞ.වෛ.නි.කාර්යාලයෙන් අනතුරු ඇඟවීම් දීම/ රතු නිවේදන නිකුත් කිරීම | ඔව්/ නැත | | |
| අදාළ දින තුළ ඩෙංගු හෝ ඩෙංගු යැයි සැක සහිත රෝගීන් වාර්තා වූයේ ද | ඔව්/ නැත | | |
| වෙනත් කරුණු | | | |

**මෙම වාර්තාව සහතික කරන නිලධාරියගේ නම, තනතුර සහ අත්සන :**
..................................................................

**මෙම වාර්තාව 2026 ජූලි 03 වන සිකුරාදාට පෙර ඩෙංගු මර්දන කමිටුව විසින් අදාල ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) වෙත ද පිටපතක් සහිතව තම ආයතන ප්‍රධානියාට වාර්තා කළ යුතු අතර ආයතන ප්‍රධානියා විසින් ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු ය.**

CS CamScanner

ඇමුණුම 02

# ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂා කිරීම පිළිබඳ මාසික වාර්තාව

රජයේ ආයතන/ පෞද්ගලික ආයතන/ පාසල් සහ අධ්‍යාපන ආයතන/ ඉදිකිරීම් පරිශ්‍ර/ ආගමික ස්ථාන/ ධීවර හා ධීවර වරායන් ආශ්‍රිතව

ආයතනයේ නම සහ ලිපිනය - මාසය - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය -

| මදුරු කීටයන් සහිත හෝ මදුරුවන් බෝ විය හැකි ස්ථාන | 01 වන සතිය | | 02 වන සතිය | | 03 වන සතිය | | 04 වන සතිය | | 05වන සතිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | හමු වූ ගණන | නිවැරදි කල ගණන | හමු වූ ගණන | නිවැරදි කල ගණන | හමු වූ ගණන | නිවැරදි කල ගණන | හමු වූ ගණන | නිවැරදි කල ගණන | හමු වූ ගණන | නිවැරදි කල ගණන |
| ඉවත ලන භාජන සහ අයිතමයන් | | | | | | | | | | |
| ජාල ටැංකි සහ ජලය රැස් කරන බඳුන් | | | | | | | | | | |
| ජලය නොබසින කානු සහ ගලිවලවල් | | | | | | | | | | |
| වැහි පිහිලි | | | | | | | | | | |
| පොකුණු සහ පක්ෂි තටාක | | | | | | | | | | |
| ජලය බැසීම අවහිර වූ මල් බඳුන් සහ තැටි | | | | | | | | | | |
| කොන්ක්‍රීට් ස්ලැබ් | | | | | | | | | | |
| ටයර් | | | | | | | | | | |
| ගස් බෙන/ බ්‍රෝමිලිය ශාක | | | | | | | | | | |
| භාවිත නොකරන වැසිකිළි උපාංග සහ ටැංකි | | | | | | | | | | |
| ශීතකරණ/ වායු සමීකරණ තැටි | | | | | | | | | | |
| මල් බඳුන් | | | | | | | | | | |
| වෙනත් | | | | | | | | | | |
| මුළු ගණන | | | | | | | | | | |
| පරීක්ෂා කල දිනය සහ පරීක්ෂාව මෙහෙය වූ නිලධාරියාගේ නම | | | | | | | | | | |

CamScanner